පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



දිනය Date 2025.04.02 පැය 2135 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/625/ 2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk


**ජනාධිපති අරමුදලින් මුදල් ලබා ගැනීමේදී අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමශර්න - අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුව.**

2008 වසරේ සිට 2024 වසර දක්වා කාලය තුල ජනාධිපති අරමුදලින් මුදල් ලබා ගැනීමට අදාලව හිටපු අමාත්‍යවරුන් හා පාලරීමේන්තු මන්ත්‍රීවරුන් විසි දෙදෙනෙකු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ මූල්‍ය හා වාණිජ අපරාධ විමශර්න අංශය මඟින් විමශර්න ආරම්භ කර ඇත.

ජනාධිපති අරමුදලින් මෙම මුදල් ලබා ගැනීමට අදාලව පවත්වාගෙන ගිය ගොනු 22 ක් විමශර්න නිලධාරින් භාරයට ගෙන ඇත. එම ගොනු වලට අදාලව හිටපු අමාත්‍යවරුන් හා පාලරීමේන්තු මන්ත්‍රීවරුන් විසි දෙදෙනා විසින් විවිධ මුදල් ප්‍රමාණයන් වශයෙන් රුපියල් කෝටි 10 කට අධික මුදලක් ලබා ගෙන ඇති බවට අනාවරණය වී ඇති අතර, එම මුදල් ලබා ගැනීමේදී යම් අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද යන්න පිළිබඳව විමශර්න කටයුතු සිදු කරනු ලබයි.

ඒ අනුව සිදු කරගෙන යනු ලබන විමශර්න වලට අදාලව ජනාධිපති අරමුදලේ ගිණුමෙන් නිකුත් කරන ලද චෙක්පත් පිළිබඳ විස්තර ලබා ගැනීම සඳහා විමශර්න නිලධාරින් විසින් කොළඹ කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් 2025.04.02 වන දින නියෝගයක් ලබා ගැනීමට පියවර ගෙන ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**